


# වෙසක් සදහම් හසුන

ති්ලොවග මුනි රජුන් ගේ
ගුණ ගැයෙන
මේ වෙසක් සමය තුළ
ඔබේ ජීවිතය
සීලයෙන් සුවඳවත් වේවා !
සමාධියෙන් නිසසල වේවා !
ප්‍රඥාවෙන් සාරවත් වේවා !

දියාබර යාලුවේ...

බුදු සුවඳ මුළු තුන් ලොකය පුරා ම පැතිරිලා යන සුන්දර වෙසක් සමයක් ආයෙමත් උදාවෙලා....

තුන්ලෝ තිලක සණරාමර සම්බුදු සමිඳාණන් ගෙ ගුණ සුවඳ සිහි කරන්න පරිසරය පවා සූදානම් වෙනවා. ලා දලු කොල වලින් සැරසුනු ගස් වල අතු අග, සුන්දර මල් කිණිති ලෙලදෙනවා. ඒ මල් කිණිති අග රැඳුනු පිණි බින්දු, හිරු එලිය වැටිලා දේදුණු වර්ණවලින් බැබලෙනවා. ඇත්තට ම මුලු ලෝකය ම සුන්දර වෙලා.


මීට අවුරුදු දෙදහස් හයසිය තිස් දෙකකට කලින් මේ වගේ ම වෙසක් සමයක තමයි, අපි වෙනුවෙන් ම අනන්ත අපරිමිත වාරයක් තමන් ගේ ජීවිතය පූජා කරපු ඒ මහ බෝධිසත්වයන් වහන්සේ මේ ලෝකයට පහළ වුනේ. ඒ වගේ ම, තමන් වහන්සේ විඳිමින් හිටපු දිව්‍යමය සැප සම්පත් හැම එකක් ම ත් අතහැර දමල, ආදරණීය යසෝදරා දේවිය ත්, කිරිකැටි රාහුල පුතා ව ත් අතහැර දමල, අපි ගැන ම අනුකම්පාවෙන් අභිනිෂ්ක්‍රමණය කළ ඒ මහා පුරුෂයාණන් වහන්සේ, දස මාර සේනා පරාජය කරල උතුම් සම්බුද්ධත්වයට පත් වුනෙත් මේ වගේ ම වෙසක් සමයක යි.

ඒ විතරක් නෙවෙයි, ජාති ජරා මරණ, රාග ද්වේශ මෝහ ගිනි දැල් වලින් ඇවිලි ඇවිලී දුක් විඳින දෙව් මිනිස් ලෝකයා ව, අමා සදහම් වැස්සෙන් නිවා සනසවල, සම්බුදු කිස නිම කරපු බුදු සමිඳුන්, පහන් සිලක් නිවී යනව වගේ පිරිනිවන් පා වදාලෙ ත් මේ වගේ ම සොඳුරු වෙසක් සමයක යි.

ඉතින් වසර දහස් ගණනක් ගත වුනත් අදටත් ජීවමාන ඒ බුදු සමිඳුන් ගේ ගුණ කඳ, ධර්මය තුළින් හඳුන ගන්න අපි මහන්සි ගන්න ඕනෙ.

දයාබර යාලුවේ...

දැන් මම ඔයාට කියන්න යන්නේ මීට අවුරුදු දෙදහස් පන්සිය පනස් දෙකකට කලින් උදාවුන ඒ සුන්දර වෙසක් පොහෝ දිනයේ දී සිදු වුනු සිදුවීමක්. එදා අප ගේ භාග්‍යවතුන් වහන්සේ කුසිනාරා නුවර උපවර්තන සාල වනෝද්‍යානයේ යමා සල් රුක් දෙක අතර පනවා තිබුණ පිරිනිවන් මඤ්චකයේ, උතුරු දිශාවට සිරස පිහිටුවාගෙන, පිරිනිවන අපේක්ෂාවෙන් වැඩ සිටිය.




බුදු සුවඳ හඳුනාගත්ත ඒ යමා සල් රුක්වල හරි ම පුදුම විදියට සල් මල් පිපෙන්න පටන් ගත්තා. පිපුණු සල් මල් එකින් එක සුගත තථාගත බුදු සමිඳුන් ගේ ශ්‍රී ශරීරය මත පතිත වෙන්න පටන් ගත්තේ ඒ ගුණ කඳට පුෂ්පෝපහාර දක්වන්න යි. ඒ වගේ ම දිව්‍යමය මදාරා මල්, දිව්‍යමය සඳුන් ආදිය ත් ආකාසයෙන් බුදු සිරුර පුරා වැගිරෙන්න පටන් ගත්තා.

එදා මුලු කුසිනාරා නුවර ම කුණු කාණු පවා වැහිල යන තරමට දණක් පමණ උසට, දිව්‍යමය මදාරා මල් වැගිරිලා තිබුණු බව මහා පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් වෙනවා.

තමන් වහන්සේ උදෙසා දෙව් මිනිස් ලෝකයා සිදු කරන මේ පූජාවන් ගැන බුදු රජාණන් වහන්සේ ගේ සිතේ තිබුනේ අපරිමිත උපේක්ෂාවක්. ඉතින් ඒ විදියට පුද පූජා පැවැත්වෙද්දී බුදු රජාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේ අමතල මෙහෙම දේශනා කළා.

"බලන්න ආනන්ද, මේ යමා සල් රුක් මුළුමණින් ම අකලට පිපිණු මල් වලින් පිරිල ඉතිරිලා ගිහින්. ඒ මල් තථාගතයන් වහන්සේට පූජා පිණිස,

තථාගත ශරීරය මත වැගිරෙනවා. දිව්‍යමය මදාරා මල්, දිව්‍යමය සඳුන්, තථාගතයන් වහන්සේට පුද පූජා පිණිස ආකාශයෙන් තථාගත ශරීරය මත වැගිරෙනවා. දිව්‍යමය තූර්ය වාදන, දිව්‍යමය සංගීත තථාගතයන් වහන්සේට පූජා පිණිස අහසේ වැයෙනවා. නමුත් ආනන්ද, මෙපමණකින් තථාගතයන් වහන්සේට පුද සත්කාර කළා වෙන්නේ නැහැ.





ආනන්ද යම් භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ උපාසකයෙක් හෝ උපාසිකාවක් හෝ තථාගතයන් වහන්සේ විසින් දේශනා කොට වදාළ ධර්මයට අනුව, ඒ ධර්මයේ හැසිරෙමින් තමන් ගේ ජීවිතය ගත කරනවා නම් ඔහු තමයි තථාගතයන් වහන්සේට සැබෑ ලෙස ම සත්කාර කරන්නේ, ගරුකාර කරන්නේ, පුද පූජා දක්වන්නේ. එම නිසා ආනන්ද, 'ධර්මයට අනුව හැසිරෙමින් සිය ජීවිතය ගත කරනවා' කියා, ඔබ විසින් හික්මිය යුතු යි."



(මහා පරිනිබ්බාන සූත්‍රය-දීඝ නිකාය)



ඉතින් දයාබර යාලුවේ..

දැන් ඔයාට තේරෙනවා ඇති, ඒ මහා කාරුණික බුදු රජාණන් වහන්සේ තමන් වහන්සේ ගේ ශ්‍රාවකයන් ගෙන් බලාපොරොත්තු වුනේ මොකක් ද කියලා. උන්වහන්සේ තමන් වහන්සේ ගේ ශ්‍රාවකයන් ගෙන් බලාපොරොත්තු වුනේ එක ම එක දෙය යි. යම් ශ්‍රාවකයෙක් තමන් වහන්සේ විසින් දේශනා කළ ධර්මයට අනුව ජීවත් වෙලා, සංසාර දුකින් නිදහස් වෙනවා නම්, අන්න ඒක තමයි තථාගතයන් වහන්සේ ගේ ඒකායන අපේක්ෂාව වුනේ.



අන්න ඒ නිසා අපි ත් මේ සුන්දර වෙසක් සමයේ ප්‍රතිපත්තියට ම මුල් තැන දීල කටයුතු කරන්ට ඕනේ. කොයි තරම් කොඩි සේසත් එල්ලුව ත්, කොයි තරම් ගොඩනැගිලි හැදුව ත්, කොච්චර දන්සැල් පැවැත්වුව ත්, තොරන් බැන්ද ත්, ගමක් ගමක් ගානේ බණ කිව්ව ත්, සීල සමාධි ප්‍රඥා වඩන්නේ නැත්නම් බුදු සසුන බැබලෙන්නේ නැහැ. තථාගත බුදු සමිඳුන්ට පුද පූජා පැවැත්වූවා වෙන්නෙත් නැහැ.

සමහර විට මේ වෙසක් සමයේ ඔයා ගේ යාලුවෝ එකතු වෙලා නොයෙක් දේවල් කරාවි. වන්දනා ගමන් යනවා කියන ලේබලේ ගහගෙන විනෝද චාරිකාවල යාවි. විවිධාකාර හිස් දේවල්වලින් ජීවිතේට සතුට සොයාවි.



නමුත් ඔයා නම් ඒ දේවල් වලට චුට්ටක් වත් පැටලෙන්න එපා. පුලුවන් කමක් තිබෙනවා නම් ඒ යාලුවො හැම දෙනාමත් එකතු කරගෙන මේ වෙසක් පෝයට සිල් සමාදන් වෙන්න. ජීවිත අවබෝධයට හේතු වෙන බුදු රජාණන් වහන්සේ ගේ උතුම් ධර්මය ශ්‍රවණය කරන්න. ධර්ම සාකච්ඡා පවත්වන්න. හැමෝ ම එකතු වෙලා භාවනා කරන්න. ප්‍රතිපත්ති පූජාවෙන් ම තථාගත බුදු රජාණන් වහන්සේට පුද පූජා සිදු කරන්න උත්සාහ දරන්න.

එහෙම කරන්න පුලුවන් උනොත් අර්ථවත් වගේ ම සුන්දර වෙසක් සමයක් ගත කළා කියල සතුටු වෙන්න ඔයාට පුලුවන් වේවි !

ඉතින් දයාබර යාලුවේ.... උතුම් ශ්‍රී සද්ධර්මය තුළින් එකතු කරගත් මේ බුදු ගුණ ටික ඔයාට වෙසක් පඬුරක් ම වේවා !

★ ප්‍රඥා ආලෝකය ඇති කරනා හෙයින්, සුගත තථාගතයන් වහන්සේ ආලෝකකර වන සේක !

★ ප්‍රඥා රශ්මිය ඇති කරනා හෙයින්, සුගත තථාගතයන් වහන්සේ ආභාසකර වන සේක !

★ ප්‍රඥා බැබලීම ඇති කරනා හෙයින්, සුගත තථාගතයන් වහන්සේ උජ්ජෝතකර වන සේක !

★ ප්‍රඥා ගිනි සිලුව ඇති කරනා හෙයින්, සුගත තථාගතයන් වහන්සේ ඕභාසකර වන සේක !

★ ප්‍රඥා දීප්තිය ඇති කරනා හෙයින්, සුගත තථාගතයන් වහන්සේ පභාසකර වන සේක !

★ ප්‍රඥා ප්‍රදීපය දල්වා ලූ හෙයින්, සුගත තථාගතයන් වහන්සේ පදීපංකර වන සේක !

★ සසර දුක් කෙළවර කරනා හෙයින්, සුගත තථාගතයන් වහන්සේ අන්තකර වන සේක !

★ නිර්වාණ අමෘතය ඇති කරනා හෙයින්, සුගත තථාගතයන් වහන්සේ අමතකර වන සේක !



★ කරුණාවෙන් පිරිගිය ආකරයක් වැනි හෙයින්, සුගත තථාගතයන් වහන්සේ කරුණාකර වන සේක !

★ නිර්භය භාවය ඇති කරනා හෙයින්, සුගත තථාගතයන් වහන්සේ ඛේමංකර වන සේක !

★ අවිදු අඳුරු දුරු කරනා හෙයින්, සුගත තථාගතයන් වහන්සේ තමන්තකර වන සේක !

★ අඳුරු ලොව එළිය කරනා හිරු මඬල බඳු හෙයින්, සුගත තථාගතයන් වහන්සේ දිවාකර වන සේක !

★ නිවන් දිවයින ඇති කරනා හෙයින්, සුගත තථාගතයන් වහන්සේ දීපංකර වන සේක !

★ තුන් ලොව එළිය කරනා හෙයින්, සුගත තථාගතයන් වහන්සේ පභංකර වන සේක !

★ සියලු ගැටලු කෙළවර කරනා හෙයින්, සුගත තථාගතයන් වහන්සේ පඤ්හානන්තකර වන සේක !

★ සසර බැමි සිඳලන හෙයින්, සුගත තථාගතයන් වහන්සේ බන්ධන පමුඤ්චකර වන සේක !

★ සතුටින් යුතු නුවණ ඇති කරනා හෙයින්, සුගත තථාගතයන් වහන්සේ වේදකර වන සේක !

★ ගුණ මැණික් ආකරයක් බඳු හෙයින්, සුගත තථාගතයන් වහන්සේ රතනාකර වන සේක !

ජීවිතාවබෝධය වේවා !

ඔයාට බුදු සරණ යි !

මීට,

අරලියා දිව්‍යාංජලී..

(එක ම අදහසක්, බෝහෝ පිරිසක්.

'The last foundation' වෙනුවෙන්..)

lastfoundation@gmail.com

